**බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව**
**හම්බන්තොට දිස්ත්‍රික්කය**

-------------------------------

**1 මූල්‍ය ප්‍රකාශන**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 31 දිනද , ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 27 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 ජූලි 21 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින්වන බලපෑම හැර , මූල්‍ය ප්‍රකාශන වලින් 2014 දෙසැම්බර් 31 දිනට බෙලිඅත්ත ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වසරට අදාල පළාත් පාලන විශ්‍රාම වැටුප් දායක අරමුදලට ගෙවිය යුතු රු. 112,633 ක වියදම් වසරේ වියදමින් හා ණය හිමියන්ගෙන් අත්හැරි තිබුණි .

(ආ) 2014 වසරේ මන්ත්‍රී ප්‍රතිපාදන හා උපමාන පාදක අරමුදල් යටතේ එකතුව රු.2,424,717 ක් සභාව වෙත ලැබී තිබූ අතර එය ප්‍රාග්ධන ආදායම් (3.80) යටතේ ගිණුම්ගත කර තිබුණි.2014 දෙසැම්බර් 31 දිනට ණයගැති වෙන් කිරීම් තුළ මෙම මුදලින් රු.2,215,045 ක්වූ ප්‍රාග්ධන ආදායම් ලැබිය යුතු ආදායම් ලෙස නැවත ගිණුම්ගතකර තිබුණි.

(ඇ) ඉකුත් වසරේ සිට ඉදිරියට එමින් පැවති එකතුව රු. 2,998,804 ක් වූ කර්මාන්ත 06 ක වටිනාකම ණයගැති වෙන් කිරීම් හා ණයහිමි වෙන්කිරීම් තුළ ඇතුළත් වී තිබූ අතර එම කර්මාන්ත ඉටුකිරීම් අවලංගු කර තිබුනද, එම වටිනාකම 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවලින් ඉවත්කර නොතිබුණි.

(ඇ) ඉකුත් වර්ෂයේ ඉටු කරන ලද ප්‍රාදේශීය සභා ඉදිරිපස හා පිටුපස කාර්යාල ප්‍රතිව්‍යුහගත කිරීම වෙනුවෙන් 2014 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු වටිනාකම රු. 571,300 ක් වුවද, මූල්‍ය ප්‍රකාශනවල රු. 437,671 ක් ලෙස දැක්වීම හේතුවෙන් කර්මාන්ත ණයහිමියන් රු. 133,629 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ) සභාව සතු, එකතුව රු. 430,251 ක්වූ ගොඩනැගිලි, නගර සංවර්ධන කටයුතු සඳහා ඉවත් කර තිබුණද, මූල්‍ය ප්‍රකාශනවල ඉඩම් හා ගොඩනැගිලි වටිනාකම් වලින් එම වත්කම් ඉවත් කර නොතිබුණි.

(ඊ) 2014 දෙසැම්බර් 20 දින මාර්ග නඩත්තු කටයුතු සඳහා සභාව වෙත පරිත්‍යාග ලෙස ලැබී තිබුණු ෆෝටන් ඩ්‍රම් ට්‍රක් ටිපර් රථයේ වටිනාකම තක්සේරුකර ගිණුම්ගතකර නොතිබුණි.

### 1.3.2 අවිධිමත් ගනුදෙනු

ප්‍රාදේශීය සභා අරමුදල් යෙදවීම පිළිබඳ නීතිමය ප්‍රතිපාදන සලසා ඇති 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ v කොටසේ 132 වගන්තියේ නියමයන්ට පටහැනිව සභාවේ සභාපති, උප සභාපති ඇතුළු මන්ත්‍රීවරු දාහතර දෙනාට ලැප්ටොප් පරිගණක යන්ත්‍ර 14 ක් සභා අරමුදලින් මිළට ගැනීම සඳහා 2014 ජුනි 26 දින පැවති මහා සභා රැස්වීමේදී යෝජනා සම්මතකර රු. 1,048,600 ක් වටිනා ලැප්ටොප් පරිගණක යන්ත්‍ර 14 ක් 2014 සැප්තැම්බර් 18 දින සභා අරමුදලින් මිළට ගෙන ලබාදී තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 264,134 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 1,860,839 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම් , තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය ආදායම | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු. '000 | රු. '000 | රු. '000 |
| i. | වරිපනම් හා බදු | 2,586 | 2,755 | 1,225 |
| ii. | බදුකුලී | 8,940 | 7,541 | 1,208 |
| iii. | බලපත්‍ර ගාස්තු | 573 | 832 | - |
| iv. | වෙනත් ආදායම් | 40,249 | 38,106 | 100,945 |

### 2.2.2 වරිපනම් බදු

සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ වරිපනම් බදු ආදායම වූ රු. 1,214,028 ක් අයකර ගැනීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158 (1) (අ) වගන්තිය ප්‍රකාර කටයුතුකර නොතිබුණි.

### 2.2.3 බදුකුලී

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) කඩ කාමර කුලි**

එකතුව රු. 678,410 ක මුදලක් 2014 දෙසැම්බර් 31 දිනට හිඟව පැවතියද මෙම හිඟ මුදල් අයකර ගැනීම සම්බන්ධයෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 159 (1) වගන්තිය ප්‍රකාරව කටයුතුකර නොතිබුණි.

**(ආ) ටෙන්ඩර් පරිපාටිය අනුගමනය නොකිරීම**
---------------------------------------------

දකුණුපළාත් පළාත් පාලන කොමසාරිස්වරයාගේ 2011 ජනවාරි 01 දින අංක දපපා/පපාකො/ 2010/ 01 දරන චක්‍රලේඛයේ 01 ඡේදය ප්‍රකාරව සභාව සතු කඩ කාමර එක්වන් මුදලක් ලබාගෙන විවෘත ටෙන්ඩර් පරිපාටිය අනුගමනය කර බදු දීම කළ යුතු බවත් බදුකරුවන් තෝරා ගැනීමේදී විධිමත් සහා සම්මතයක් ලබා ගත යුතු බවත්, සඳහන් වුවද, සභාවට අයත් සියලුම කඩ කාමර බදු දීම සම්බන්ධයෙන් ඉහත විධිවිධාන ප්‍රකාරව සභාව කටයුතුකර නොතිබුණි.

**(ඇ) කඩකාමර උපබදු දීම**
-----------------------

උක්ත චක්‍රලේඛයේ 11 ඡේදය ප්‍රකාරව බදුකරු වෙනත් පාර්ශවකරුවෙකු වෙත බදු අයිතිය පැවරීම සභාවේ අනුමැතියකින් තොරව කිසිසේත් නොකළයුතු බව සඳහන් වුවද කඩ කාමර 16 ක් එකී විධිවිධානයට පටහැනිව උපබදු දී තිබූ බව 2015 පෙබරවාරි 20 දින සිදු කරන ලද ස්ථානීය පරීක්ෂණයේදී නිරීක්ෂණය විය.

**2.2.4 යන්ත්‍රෝපකරණ ආදායම්**
--------------------------------

සභාව විසින් බැකෝ යන්ත්‍රය, මෝටර් ග්‍රේඩරය, ලොරි බවුසරය හා ගලි බවුසරය සේවයේ යෙදවීම වෙනුවෙන් එකතුව රු. 1,145,969 ක මුදලක් වසර අවසානයට හිඟව පැවතියද එම හිඟ ආදායම් අයකර ගැනීමට ක්‍රියාකර නොතිබුණි.

**2.2.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු**
-----------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2014 දෙසැම්බර් 31 දිනට එකතුව රු. 9,231,206 ක මුදලක් උසාවි දඩ සහ මුද්දර ගාස්තු වශයෙන් ලැබිය යුතුව තිබුණි.

**3. පද්ධති හා පාලන**

**---------------------**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) වත්කම් කළමනාකරණය

(ඇ) සේවක පරිපාලනය

(ඈ) ආදායම් පරිපාලනය